# ලංකා ඉතිහාසය

## 6.3.3 කෝට්ටේ රාජධානියේ පරිහානිය විස්තර කරයි



නිපුණතාව : 6

නිපුණතා මට්ටම : 6.3.3

කෝට්ටේ රාජධානියේ පරිහානිය විස්තර කරයි

## හයවන පරාක්‍රමබාහු රජතුමාගෙන් පසු කෝට්ටේ දේශපාලන තත්ත්වය.

අවසන් වරට ලංකාව එක්සේසත් කොට මෙරට දේශපාලනය, ආර්ථික, සංස්කෘතික වශයෙන් බැබළවූ හයවන පරාක්‍රමබාහු රජතුමාගෙන් පසු කෝට්ටේ දේශපාලන තත්ත්වය පිළිබඳ විමර්ශනය කිරීමේ දී කැපී පෙනෙන ලක්ෂණය වන්නේ ක්‍රම-ක්‍රමයෙන් කෝට්ටේ රජධානිය පමණක් නොව ලංකාවේ දේශපාලන පරිහානිය ආරම්භ වීමට මග පෑදුණු බවයි.

ඒ පිළිබඳ හැදෑරීමේ දී VI පරාක්‍රමබාහු රජතුමාට පසු කෝට්ටේ රජ වූ රජවරුන්ගේ කාර්ය සංසිද්ධි විමසා බැලීමෙන් තහවුරු වේ.

එතුමාගෙන් පසු කෝට්ටේ පාලනය ගෙන ගිය රජවරුන් 8 දෙනෙක් පිළිබඳ ඉතිහාසයෙන් සඳහන් වේ.

VI පරාක්‍රමබාහු
↓
II ජයබාහු
↓
VI වන බුවනෙකබාහු
↓
VII පණ්ඩිත පරාක්‍රමබාහු
↓
VIII වීර පරාක්‍රමබාහු
↓
IX ධර්ම පරාක්‍රමබාහු
↓
VI විජයබාහු
↓
VII බුවනෙකබාහු
↓
දොන් ජුවන් ධර්මපාල
↓

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස් ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම : - එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය,

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# කෝට්ටේ රජ පෙළපත

- ළමැනි ජයමහ ලැණ + සුනේත්‍රා මහා දෙවි
- VI පරාක්‍රමබාහු **(1)** + කිරවැල්ලේ බිසව
  ක්‍රි. ව. 1410
  1412
  1415-1467
  හදා ගත් දරුවෝ
  - ධන මැණිකා + VI බුවනෙකබාහු **(3)** (සපුමල් කුමරු) 1469 - 1490
    - VII පණ්ඩිත පරාක්‍රම බාහු **(4)** (1480—1490)
  - VIII වීර පරාක්‍රමබාහු **(5)** (අම්බුලුගල කුමරු) (1490 - 1509)
    - VI විජයබාහු **(6)** (1510 - 1521)
      - VII බුවනෙකබාහු **(7)**
        - විදිය බණ්ඩාර + සමුද්‍රදේවී
          - දොන් ජුවන් ධර්මපාල **(8)**
      - රයිගම් බණ්ඩාර
      - මායාදුන්නේ
        - රාජසිංහ
    - IX ධර්ම පරාක්‍රමබාහු
    - තනිය වල්ලභ
    - සකල කලා වල්ලභ
    - රාජසිංහ
  - උලකුඩය දේවිය + නන්නුර්තුනයා
    II ජයබාහු **(2)** (1467 - 1469)

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

# II ජයබාහු

VI වෙනි පරාක්‍රමබාහු රජතුමාගෙන් පසුව කෝට්ටේ සිංහාසනාරූඪ වුයේ පරාක්‍රමබාහු රජුගේ දියණිය වූ උලකුඩය දේවියගේ නන්නුර්තුනයාර්ට දාව උපන් II ජයබාහු කුමරු ය.

ඔහු වීර පැරකුම් නමින් රජ විය. නමුත් ඔහුගේ පාලන කාලය වසර දෙකකට සීමා විය. ඒ වනවිට යාපනය පාලනය කරමින් සිටි සපුමල් කුමරු II ජයබාහු මරා VI වැනි බුවනෙකබාහු නමින් රජ විය.

# VI වැනි බුවනෙකබාහු

සපුමල් කුමරු යාපනය ජයගත් විරයා වුවත් රජකමට පත් වීමත් සමඟ අභ්‍යන්තර අවුල් වියවුල්වලට මුහුණ දීමට ඔහුට සිදු විය. ඔහුගේ 4 වැනි රාජ වර්ෂයේ දී සිංහල සංගය (ඇදිගම සෙල්ලිපිය) සිංහල පෙරළිය (රාජාවලිය) නමින් හඳුන්වන කැරැල්ලකට මුහුණ දීමට සිදුවිය.

සපුමල් කුමරු කෝට්ටේ රජ වීම සිංහලයන්ගේ අකැමැත්තට හේතු විය. මේ හේතුව නිසා 1476 පමණ ඔහුට විරුද්ධව සිංහල පෙරළිය නම් කැරැල්ල ඇති විය යැයි, ජී. සී. මෙන්ඩිස් පවසයි.

(History of Ceylon Chap.5)

**සිංහල සංග්‍රහය**
පස්දුන් කෝරලයේ කැකුලන්දොළ සිරිවර්ධන පතිරාජයන්ගේ සහ කුරගම හිමියන් යන ජන ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන් ඇති වූ මෙම කැරැල්ල සිංහල සංගය යනුවෙන් මූලාශ්‍රවල සඳහන් වේ.

සිංහලයන් ඔහුට විරුද්ධ වීමට හේතු ලෙස,

- ඔහුගේ පියා පනික්කි නිසා පිය පාර්ශ්වයෙන් ද්‍රවිඩ වීම.
- නීත්‍යානුකූල රජකම උරුම වූ II ජයබාහු මරා රජ වීම

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

සමහර විට ජයබාහු කුමරුට පක්ෂ වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ආදීන් මුල් වී යයි ජී. සී. මෙන්ඩිස්ගේ (History of Ceylon - chap 5 )ග්‍රන්ථයට අධෝලිපියක් එකතු කළ පොල්වත්තේ බුද්ධදත්ත හිමි පවසති.


මෙම කැරැල්ල මැඩ පැවැත්වීමට බුවනෙකබාහු තම සොහොයුරු වූ අම්බුලුගල කුමරු සේනා සමග එහි යැවීය. කුමරු කැරැල්ල මර්දනය කර කැරලි ප්‍රධානින් රජු වෙත ගෙන ගොස් ඇත. ක්‍රි. ව. 1474 පමණ වන විට කැරැල්ල සංසිඳී ගිය ද අම්බුලුගල කුමරු කෝට්ටේ රාජ්‍යයට පැමිණි අතරවාරයේ, නැවතත් සතර කෝරලයේ ජනතාව රජුට විරුද්ධව නැගී සිටියහ. එයට හේතු වූයේ මේ කාල වකවානුවේ මහනුවර සෙංකඩගල සේනාසම්මත වික්‍රමබහු නම් කුමාරයෙක් තම ස්වාධීනත්වය ප්‍රකාශ කොට කෝට්ටේ ආධිපත්‍යයෙන් මිදී ක්‍රියා කිරීම යි.

උඩරට සේනාසම්මත වික්‍රමබාහු රජු සතර කෝරලයට පැමිණ එම ප්‍රදේශයේ ප්‍රධානීන් තමාට පක්ෂපාත කරගත් බව අලුත් නුවර දේවාල භූමියේ ඇති සෙල්ලිපියක සඳහන් වේ.

සේනාසම්මත වික්‍රමබාහුගේ ක්‍රියාවට ක්ෂණික ප්‍රතිචාර දැක්වූ vi වන බුවනෙකබාහු රජතුමා එම ප්‍රදේශය (සතර කෝරලය ) ආක්‍රමණය කොට එහි ජන ප්‍රධානින් නැවත වරක් තමාට පක්ෂපාති කරවා ගත් බව 1478 දී බුවනෙකබාහු රජු විසින් දැදිගම පිහිටුවා ඇති පුවරු ලිපියෙන් හෙළිවේ.

ඉහත සඳහන් කරුණු අනුව vi වන බුවනෙකබාහු රජුට දේශපාලන ගැටලු රැසකට මුහුණ දීමට සිදු බවත්, එම ගැටලු සාර්ථකව විසඳා ගත් බවත් පෙන්වා දිය හැක. එතුමාගෙන් පසු සිහසුනට පත් වූයේ ඔහුගේ පුත් vii වන පරාක්‍රමබාහු ය.

නමුත් VI පරාක්‍රමබාහු එක්සේසත් කළ ලංකාව ඔහු මියගොස් වසර 10ක් ගතවීමට පෙර කැඩී බිඳී ගිය බව පෙනේ. බුවනෙකබාහු රජුගේ රාජ්‍ය කාලය අවසාන වන විට පැහැදිලි ලෙස ලංකාවේ ස්වාධීන රාජ්‍ය 3ක් දක්නට ලැබුණි.




16 වන සියවස ආරම්භයේ දී ලංකාවේ දේශපාලන බෙදීම

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස් ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම : - එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍රදේවී බාලිකා විද්‍යාලය,

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## අම්බුලුගල කුමරු අටවන වීර පරාක්‍රමබාහු නමින් රාජ්‍යත්වයට පත් වීම.

අම්බුලුගල කුමරු VII වන පරාක්‍රමබාහු රජු මරා අටවන වීර පරාක්‍රමබාහු නමින් කෝට්ටේ රජවිය. 6 වෙනි බුවනෙකබාහුට විරුද්ධව ඇරඹුණු සිංහල පෙරළිය මැඩලූ ඔහු අම්බුලුගල වාසය කළේ ය.

VI වන බුවනෙකබාහුගේ මරණින් පසු රජවීමේ අභිලාෂයෙන් සිටි ඔහු VII වන පරාක්‍රමබාහුට විරුද්ධව සේනා ගෙන සතර කෝරලයේ ජනයා සමග කැලණියේ වාඩි ගති.

### අට වැනි වීර පරක්‍රමබාහු

ක්‍රි. ව. 1490 දී සතර කෝරලයේ යුවරජ තනතුර දැරූ අම්බුලුගල කුමරු සේනා සන්නද්ධව කෝට්ටේ පැහර ගැනීම සඳහා පැමිණි බව රාජාවලියේ සඳහන් වේ. කැලණිය අසලදී අම්බුලුගල කුමරුට දරුණු ප්‍රහාරයක් එල්ල වුවත් ඔවුන් පරදා කෝට්ටේ රාජ්‍යයට කඩා වැදී ඔහු vii පරාක්‍රමබාහු මරණයට පත් කොට viii වීර පරාක්‍රමබාහු නමින් කෝට්ටේ රජ විය.

(පරාක්‍රමබාහු නමින් රජ වූ අට වැන්නා නිසා ඔහු අටවැනි වීර පරාක්‍රමබාහු ලෙස හඳුන්වයි)

"මුලාශ්‍රයවල සඳහන් තොරතුරු අනුව අටවැනි වීර පරාක්‍රමබාහු රජු, වීර රජෙකු බව පේනවා දිය හැක."

මේ පිළිබඳ තොරතුරු ලැබෙන මුලාශ්‍රය,

- ඔරුවල සන්නස
- ගඩලාදෙණිය සෙල්ලිපිය
- රාජාවලිය
- කුඩුම්රිස්ස සෙල්ලිපිය
- හංස සංදේශය

වැදගත්වේ.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස් ද මැල් විදයාලය, කුරුණෑගල.
සැකසුම : - එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍රදේවී බාලිකා විද්‍යාලය,

Copyright © www.e-thaksalawa.moe.gov.lk

Copyright www.e-thaksalawa.moe.gov.lk

අටවැනි වීර පරාක්‍රමබාහු රජුගේ කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් 4ක් පිළිබඳව රාජාවලියේ ඇතුළත් මුලාශ්‍රයවලින් තොරතුරු ලැබේ.

**1.** දකුණු ඉන්දියාවේ කායල පට්ටනමෙන් මුස්ලිම් හමුදාවක් රැගෙන පැමිණි අදියරායන නම් මුස්ලිම් නායකයෙකු බලහත්කාරයෙන් හලාවත මුතු කිමිදෙන්නටත් ඇතුන් අල්ලන්නටත් පටන් ගැන්මයි. මේ අවස්ථාවේ උඩුගම්පල සිටි සකලකලාවල්ලභත් , මාදම්පේ සිටි තනියවල්ලභත් හමුදා රැගෙන මුස්ලිම් සේනා මැදට පැන සටන් කොට අදිරියාන මරා ඇතුන් ලවා ඔරු පොඩි කරවා අශ්වයින් නව දෙනෙකු හා මුතු කිමිදුන මුස්ලිම්වරුන් අල්ලා රජුට භාරදුන් බව

2. රාජාවලියේ වාර්තාවට අනුව 1495 උඩරට දිග් විජයෙන් පසු කෝට්ටේ ආධිපත්‍ය පිළිගත් මේණවර තුනයා මේ වන විට උඩරට පාලකයා වශයෙන් සිටි බව අස්ගිරි තල්පතකින් පැහැදිලි වේ. ඔහු 1497 තරමේ සිට “තුනයම”රජු වශයෙන් උඩරට පාලනය කොට ඇත.

රාජාවලියට අනුව ඔහු කෝට්ටේ රජුට අයබදු නොගෙවා තමා රජු බව ප්‍රකාශයට පත්කොට රන් පණම් කාසි නිකුත් කරමින් කැරලි ගසා ඇත.

මෙවිට මැණික්කඩවර සිටි රාජසිංහ කුමාරයා තම මස්සිනා වූ කීරවැල්ලේ මහරාලහාමිට සේනාව භාර කොට යවා කැරැල්ල මර්දනය කොට ඇත.මෙහි දී මේණවර තුනයා විසින් රිදි පණම් ලක්ෂයක්ද , ඇතුන් තුන් දෙනෙක්ද කීරවැල්ලේ සෙනෙවියාට තමාගේ දියණිය ද දී සාමදාන වූ බව රාජාවලියේ සඳහන් වේ.

3. ඉහත සිදුවිමෙන් පසු නැවත වරක් මේ උඩරට පාලකයා කෝට්ටේ රජුට එරෙහිව කැරලි ගැසූ බව රාජාවලිය සඳහන් කරයි.එවිට උඩුගම්පොළ උන් සකලකලා වල්ලභ කුමරා ඒකනායක මහ ඇමති ද සමඟ සේනාව රැගෙන යටි නුවර තෙක් ගොස් ඔහු පරාජය කර ඇත.

4. මෙවක සිදුවූ වැදගත්ම සිද්ධිය වශයෙන් දැක්වෙන්නේ පෘතුගිසින් ප්‍රථම වරට ලංකාවට පැමිණීමේ සිද්ධිය යි. පෘතුගීසි ලේඛනවලට අනුව එය 1505 වර්ෂයේ සිදුව ඇත.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස් ද මැල් විදයාලය, කුරුණෑගල.
සැකසුම : - එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍රදේවී බාලිකා විද්‍යාලය,

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# හයවැනි විජයබාහු

අටවැනි වීර පරාක්‍රමබාහු මිය යාමෙන් පසු (1509) ඔහුගේ පුතු වූ විජයබාහු කෝට්ටේ රජකමට පත් වූ බව දේශීය මූලාශ්‍ර සඳහන් කරයි .
නමුත් පෘතුගීසි වාර්තා අනුව පෙනී යන්නේ vi විජයබාහුට පෙර ධර්ම පරාක්‍රමබාහු රජ වී සිටි බව යි
සෙල්ලිපි හා සන්නස් පත්‍ර අනුව ක්‍රි.ව. 1509 සිට 1521 දක්වා කාලය තුළ හයවන විජයබාහු රජු ආගමික සේවා රැසක් කර ඇත.

## හයවැනි විජයබා රජුගේ ආගමික සේවා

* දෙවුන්දර කෝවිලට ඉඩම් ප්‍රදානය කිරීම.
* මොට්ටප්පුලියේ කෝවිලට කුඹුරු දීම.
* පැපිලියාන පිරිවෙනේ සිට පොත්පත් ලියූ අයට යැපීම් දීමනා දීම.
* කැරගල වනරතන හිමියන්ගේ ඉඩම්වලට ආරක්ෂාව සැලසීම.

ක්‍රි.ව. 1521 පමණ වන විට හයවන විජයබා රජුට කෝට්ටේ රාජ්‍යයේ අභ්‍යන්තර ආරවුල් රැසකට මුහුණ දීමට සිදුවිය.

* කොළොඹ තොටුපළ හා කෝට්ටේ රාජ්‍ය පෘතුගීසින්ගෙන් ආරක්ෂා කර ගැනීමට සිදුවීම.
* ඔහුගේ අගබිසවගේ පුතුන් තිදෙනා රජුට විරුද්ධව සටන් කිරීම. (විජයබා කොල්ලය)
* විජයබා කොල්ලය සිදුවීම්වලියේ අවසානයේ vi වැනි විජයබාහු රජු මරණයට පත් විය.

( vi වැනි විජයබාහු අවුරුදු 25ක් රජ කළ බව රාජාවලිය සඳහන් කරයි. )


* විජයබාහු රජුගේ මිය යාමෙන් පසු රජුගේ වැඩිමල් පුතු වූ බුවනෙකබාහු කෝට්ටේ රජු ලෙස අභිෂේක කර ඇත.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස් ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම : - එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍රදේවී බාලිකා විද්‍යාලය,

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## විජයබා කොල්ලය

විජයබාහු රජුගෙන් පසු කෝට්ටේ රාජධානියට උරුමකම් කිවේ ඔහුගේ අගබිසවගේ පුතුන් තිදෙනා වූ බුවනෙකබාහු, රයිගම් බණ්ඩාර සහ මායාදුන්නේ කුමරවරුන් ය. එහෙත් විජයබාහු රජු ඔවුන් තිදෙනා නොතකා තම පසුව විවාහ කර ගත් කීරවැල්ලේ බිසවගේ විවාහයෙන් ලැබුණු දේවරාජ නම් කුමරුට රජකම පවරාදීමට සැලසුම් කර තිබිණ. එපමණක් නොව කුමාරවරුන් තිදෙනා මරා දැමීමටද සැලසුම් කර තිබිණි. දේවරාජ කුමරුගෙන් මේ බව දැනගත් කුමාරවරු තිදෙනා තම පියාට එරෙහිව කළ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස සලමන් නම් විදේශිකයෙකු විසින් විජයබාහු රජු මරා දමන ලදී. කෝට්ටේ රාජධානිය පුතුන් තිදෙනා රාජධානි තුනකට බෙදා ගන්නා ලදී. මේ සිද්ධිය විජයබා කොල්ලය ලෙස හැඳින්වේ.






Copyright © www.e-thaksalawa.moe.gov.lk

# 7 වන බුවනෙකබාහු

බුවනෙකබාහු රජු උඩරට කුමරියක් පාවා ගත් අතර (රාජා-84 සිට)රජුට දාව ඇය සමුද්‍රා කුමරිය ලැබුවා ය.සමුද්‍රා කුමරිය වීදියේ බණ්ඩාරට පාවා දීමෙන් ලැබුණු දරුවන් දෙදෙනෙකි . ධර්මපාල හා විජේපාල කුමරු වේ.

කෝට්ටේ බුවනෙකබාහු රජු තම සොහොයුරන් නොසලකා හැර පෘතුගීසින්ගේ සහාය ලබා ගැනීමත්, ඔවුනට පක්ෂපාති වීමක් සිදුවිය.මේ හේතුකොටගෙන රයිගම් බණ්ඩාර හා මායාදුන්නේ රජුට විරුදධව නැගී සිටියෝ ය.ඔවුන් ඉන්දියාවේ මුස්ලිම්වරුන්ගේ ආධාර ලබාගෙන කෝට්ටේ රජුට විරුද්ධව සටන් කළහ.

1551 දෙසැ.20 දහවල් රජු කැලණියේ මාලිගයේ සිටිය දි වෙඩි පහරක් වැදී ඔත්පලව ඇත . බුවනෙකබාහු රජු ප්‍රතිකාල් වෙඩිල්ලකින් මළ බව රාජාවලිය (86 සිට) කියයි.

# ධර්මපාල රජු (1551 - 1597)

1551 දී ධර්මපාල කුමරු කෝට්ටේ රජ විය. VII වන බුවනෙකබාහු රජු මළ විගස මායාදුන්නේ යුද්ධයට පැමිණිය ද පෘතුගීසි ගෝවෙන් ආධාර පතා ආක්‍රමණ වැළක්විය. (රාජාවලිය 87 පිට) ධර්මපාල කුමරු පෘතුගීසි සහායෙන් කෝට්ටේ රජ බවට පත් විය.

1557 ධර්මපාල කුමරු කතෝලිකයෙකු වශයෙන් බෞතිස්ම ලබා ඇත.

1580 දී කෝට්ටේ ධර්මපාල රජු තමන්ට පරම්පරාවෙන් උරුම වූ කෝට්ටේ රාජධානිය තෑගි ඔප්පුවකින් පෘතුගීසින්ට පැවරී ය. 1597 රජුගේ මරණින් පසුව ඉහත තෑගි ඔප්පුවට අනුව කෝට්ටේ රාජධානිය පෘතුගීසින් සතු විය.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස් ද මැල් විදයාලය, කුරුණෑගල.
සැකසුම : - එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍රදේවී බාලිකා විද්‍යාලය,

Copyright © www.e-thaksalawa.moe.gov.lk